# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1699/40 - 2011 මාර්තු 30 වැනි බදාදා - 2011.03.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1969 අංක 17 දරන ලංකා විදුලිබල මණ්ඩල පනත**

57 වැනි වගන්තිය යටතේ ආඥාව

1969 අංක 17 දරන ලංකා විදුලිබල මණ්ඩල පනතේ 57 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව විදුලිබල හා බලශක්ති අමාත්‍ය පාඨලී චම්පික රණවක වන මම ලංකා විදුලිබල මණ්ඩලයට අවශ්‍ය වී ඇති උපලේඛනයේ විස්තර කර ඇති ඉඩම් අත්පත් කර ගැනීමේ යෝජනාව මෙම ආඥාව මගින් අනුමත කරමි.

පාඨලී චම්පික රණවක,
විදුලිබල හා බලශක්ති අමාත්‍ය.

2011 මාර්තු මස 30 වැනි දින,
විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ දීය.

**උපලේඛනය**

ශ්‍රී ලංකාද්වීපයේ නැගෙනහිර පළාතේ, මඩකලපුව දිස්ත්‍රික්කයේ, මන්මුනේ බටහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වව්නතිව් - 182ඒ සුළු කොට්ඨාසයේ වව්නතිව් ග්‍රාමයේ පිහිටි බලයලත් මිනින්දෝරු ඒ. සිංහරාජා විසින් පිළියෙල කරන ලද ඒඑස්/2010/එම්එන්ඩබ්ලිව්/211ඒ දරන 2010 නොවැම්බර් මස 01 වැනි දිනැති අනුරේඛනයෙහි පෙන්නුම් කර ඇති පහත සඳහන් පරිදි මායිම් වූ හෙක්ටයාර් 2.0234 වූ මුළු ඉඩම් ප්‍රමාණය

1. ලොට් අංක 2 - කොට්ටක්කාඩු

| | | |
|---|---|---|
| උතුරට | : | ලොට් අංක 1 ; |
| දකුණට | : | තම්බිරාසා උරුත්තුමූර්ති සහ තවත් අය හිමිකම් කියන ඉඩම ; |
| නැගෙනහිරට | : | වව්නතිව් කන්නාන්කුඩා මහ පාර ; |
| බටහිරට | : | රජයේ ඉඩම. |
| ප්‍රමාණය | : | හෙක්ටයාර් 2.0234 (අක්කර 05යි) |
| හිමිකම් කියනු ලබනුයේ | : | යෝකරන් කවීතා, අංක 21සී, සුවිස් ටැමිල් විලේජ්, තිරයිමාඩු, මඩකලපුව. |

04-453